ICRC



# අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය

**සමානතා සහ අසමානතා**

අන්තර්ජාතික මානුෂවාදී නීතිය (IHL) සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය (IHRL) එකිනෙකට වෙනස් මානයන් ඔස්සේ පුද්ගලයින්ගේ ජීවිත, සෞඛ්‍ය සහ ගරුත්වය ආරක්ෂා කිරීමෙහිලා ප්‍රයත්න දරයි. ඒ අනුව ගත් කළ සැකැස්මෙන් අසමාන වුවද ඇතැම් නීතීන්හි හරය සමාන ස්වරූපයක් නැති නම් එකම ස්වභාවයක් ගැනීම පුදුමයට කරුණක් නොවේ. නිදසුනක් ලෙස, මෙම නීති පද්ධති ද්විත්වය මගින් මනුෂ්‍ය ජීවිතය ආරක්ෂා කිරීම, වධ හිංසා පැමිණවීම හෝ කෲර සැලකීම් තහනම් කිරීම, අපරාධ යුක්ති ක්‍රියාවලියට පාත්‍ර පුද්ගලයින් සඳහා මූලික අයිතිවාසිකම් නියම කිරීම, වෙනස් කොට සැලකීම තහනම් කිරීම, කාන්තා සහ ළමා ආරක්ෂණයට අදාළව විධිවිධානයන් ඇතුළත් කිරීම, ආහාර සහ සෞඛ්‍ය සඳහා වන අයිතිවාසිකමට අදාළ අංගයන් නියාමනය කිරීම වැනි කාර්යයන් ඉටුකිරීම අරමුණු කරගනියි. අනෙක් අතට, සතුරු යුද ක්‍රියාකලාප, සටන්කරුවන් සහ යුද සිරකරුවන්ගේ තත්ත්වය මෙන්ම රතු කුරුසය හා රතු අඩසඳ ලාංඡන ආරක්ෂා කිරීම වැනි අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතියේ විෂය සීමාවෙන් පිටත වන විවිධ ගැටළු සමග අන්තර්ජාතික මානුෂවාදී නීතියේ රීතීන් ගනුදෙනු කරයි. එලෙසින්ම, ප්‍රකාශනයේ නිදහස, නිදහසේ රැස්වීමට ඇති අයිතිය, ඡන්දය ලබාදීමට ඇති අයිතිය සහ වැඩ වර්ජනය කිරීමට ඇති අයිතිය යනාදී අන්තර්ජාතික මානුෂවාදී නීතිය මගින් නියාමනය නොවන ජීවිතයේ අංගයන් සමඟ සාම කාලය තුළදී අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය ගනුදෙනු කරයි.

## අන්තර්ජාතික මානුෂවාදී නීතිය යනු කුමක්ද?

අන්තර්ජාතික මානුෂවාදී නීතිය යනු අන්තර්ජාතික හෝ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් තුළින් සෘජුව පැන නගින මානුෂවාදී ගැටළු විසඳීම විශේෂයෙන්ම අරමුණු කොටගත් ගිවිසුම් හෝ චාරිත්‍ර මගින් ස්ථාපනය කළ අන්තර්ජාතික නීති සමුදායකි. සන්නද්ධ ගැටුම් හේතුවෙන් අනාරක්ෂිත හෝ අනාරක්ෂිත විය හැකි ජනතාව සහ දේපළ එමගින් ආරක්ෂා කරන අතර ගැටුමක පාර්ශවකරුවන් හට සිය අභිමතය පරිදි යුද විධික්‍රම සහ ආකාර භාවිතා කිරීමට ඇති අයිතීන් සීමාකරනු ලබයි.

අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් සඳහා බලපාන අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ප්‍රධාන ගිවිසුම් මූලයන් වන්නේ 1949 ජිනීවා සම්මුති හතර සහ එහි 1977 පළමු අතිරේක සන්ධානයයි. අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සඳහා බලපාන ප්‍රධාන ගිවිසුම් මූලයන් වන්නේ ජිනීවා සම්මුතීන් සඳහා පොදු 3 වන වගන්තිය සහ 1977 දෙවන අතිරේක සන්ධානයයි.

## අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය යනු කුමක්ද?

අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය යනු රජයන්ගෙන් යම් නිශ්චිත හැසිරීම් හෝ ප්‍රතිලාභ බලාපොරොත්තු විය හැක්කේ සහ/හෝ ඉල්ලිය හැක්කේ කුමන තැනැත්තන් සහ පුද්ගල කණ්ඩායම් හටද යන්න පදනම්ව ගිවිසුම් හෝ චාරිත්‍ර මගින් ස්ථාපනය කළ ජාත්‍යන්තර නීති සමුදායකි. මානව අයිතිවාසිකම් යනු මනුෂ්‍යයෙකු වීම මතම සෑම පුද්ගලයෙකුටම නෛසර්ගිකව හිමිවන අයිතීන්වේ. අන්තර්ජාතික මානව අයිතිවාසිකම් ප්‍රමිති පද්ධතියට ගිවිසුම් මත පදනම් නොවූ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශන (මෘදුනීති) බොහෝ ප්‍රමාණයක්ද අයත්වේ.

සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (1966) මෙන්ම ජන සංහාර (1948), වාර්ගික වෙනස් කොට සැලකීම (1965), කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම (1979), වධ හිංසනය (1984) සහ ළමා අයිතිවාසිකම් (1989) පිළිබඳ සම්මුතිය යනාදී සියලුම සම්මුතීන් අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතියෙහි ප්‍රධාන ගිවිසුම් මූලාශ්‍ර වේ. ප්‍රධාන කලාපීය මෙවලම් වනුයේ මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීම පිළිබඳ යුරෝපා සම්මුතිය (1950), මිනිස් අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳ ඇමෙරිකානු ප්‍රකාශනය (1948) සහ මානව අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1969) සහ මානව සහ මහජන අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු ප්‍රඥප්තිය (1981) යනාදියයි.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය ඓතිහාසික වශයෙන් එකිනෙකින් වෙන්වූ වර්ධනයක් අත්පත් කරගත්තද මෑතකාලීන ගිවිසුම් වල මෙම නීති පද්ධති දෙකේම විධිවිධාන ඇතුළත් වේ. නිදසුන් ලෙස ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, එහි සන්නද්ධ ගැටුම්හි ළමා සහභාගීත්වය පිළිබඳ වෛකල්පික සන්ධානය, සහ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව දැක්විය හැකිය.

## මෙම නීති බලපවත්වන්නේ කුමන අවස්ථාවලදී ද?

අන්තර්ජාතික වුවද අන්තර්ජාතික නොවුව ද සන්නද්ධ ගැටුම් පවතින කාලයන් සඳහා අන්තර්ජාතික මානුෂවාදී නීතිය අදාළ වේ. රාජ්‍යයන් දෙකක් හෝ කිහිපයක් අතර ඇති යුද්ධ, සහ නිදහස සඳහා කරනු ලබන යුද්ධ, ජාත්‍යන්තර ගැටුම් වන අතර, යුද තත්ත්වයක් යන්න ප්‍රකාශයට පත්කර ඇත්තේ ද හෝ සහභාගිත්වය දරන පාර්ශවයන් විසින් යුද්මය තත්ත්වයක් පවතී ද යන්න හඳුනාගෙන ඇත්තේ ද යන්න ඊට අදාළ නොවේ.

අන්තර්ජාතික නොවන ගැටුම් යනු රජයේ හමුදා විසින් සංවිධානාත්මක සන්නද්ධ කණ්ඩායම් සමඟ හෝ

කැරලි කණ්ඩායම් ඔවුනොවුන් අතර ඇති කර ගන්නා ගැටුම්ය. අන්තර්ජාතික මානුෂවාදී නීතිය "සන්නද්ධ ගැටුම" නම් ව්‍යතිරේකී තත්ත්වය සමඟ පමණක් ගනුදෙනු කරන හෙයින් එහි විධිවිධානයන්ගෙන් කුමන හෝ ආකාරයක අවප්‍රමාණය වීමකට ඉඩනොදේ.

මූලධර්මානුකූලව ගත් කළ, අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය සෑම කල්හිම, එනම් සාමකාලය මෙන්ම සන්නද්ධ ගැටුම් පවතින කාලය යන තත්ත්වයන් දෙකේදීම බලපැවැත්වෙයි. කෙසේ නමුදු, ඇතැම් අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීති ගිවිසුම් මගින් ජනතාවට තර්ජනයක් විය හැකි හදිසි මහජන අවස්ථාවන්හිදී යම් නිශ්චිත අයිතීන් අවප්‍රමාණය කොට ක්‍රියාකිරීමට රජයන්ට අවකාශ සලසයි. කෙසේ වුවත්, මෙම අවප්‍රමාණය කිරීම්, පවතින අර්බුදකාරී තත්ත්වයට සමානුපාතික විය යුතු සේම, වෙනස් කොට සැලකීමේ පදනමක් සහිතව හඳුන්වා නොදිය යුතු අතර අන්තර්ජාතික මානුෂවාදී නීතිය ඇතුළු අන්තර්ජාතික නීතියේ අනෙකුත් රීතීන් හා පටහැනි නොවිය යුතුය.

ඇතැම් මානව අයිතිවාසිකම් කිසිදු දිනක කිසිදු ලෙසක අවප්‍රමාණය කළ හැකි නොවේ. එකී අයිතිවාසිකම් අතර ජීවත් වීමට ඇති අයිතිය, වධ හිංසා වලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමකට හෝ දඬුවමකට යටත් කිරීමට ඇති තහනම, වහල්භාවයට හෝ දාසභාවයට පත්කිරීමට ඇති තහනම සහ අතීතයට බලපානසේ අපරාධ නීති පැනවීමට ඇති තහනම වැනි අයිතීන් දැක්විය හැකිය.

**මෙම නීති පද්ධති මගින් බැඳෙන්නේ කවුරුන්ද?**

අන්තර්ජාතික මානුෂවාදී නීතියට සන්නද්ධ ගැටුමක සියලු පාර්ශවයන් බැඳේ: අන්තර්ජාතික ගැටුමකදී ගැටුමට පාර්ශව වන රාජ්‍යයන් විසින් එය අනුගමනය කළයුතු අතර අභ්‍යන්තර ගැටුමකද එමගින් බැඳෙනුයේ රජය, සහ ඊට එරෙහිව සටන් වදින කණ්ඩායම් හෝ ඔවුනොවුන් අතර සටන් වදින කණ්ඩායම්ය. එලෙස, අන්තර්ජාතික මානුෂවාදී නීතිය මගින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන යන දෙපාර්ශවයටම බලපාන රීතීන් දක්වයි.

තනි තනි පුද්ගලයින් සමඟ වන සිය සබඳතා වලදී රජයන් බැඳීමට ලක් කරන රීතීන් අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය මගින් දක්වයි. මානව අයිතිවාසිකම් ප්‍රතිමායන් කෙරෙහි ගරු කිරීමක් බලාපොරොත්තු විය හැක්කේ කුමන ආකාරයේ රාජ්‍ය නොවන පාර්ශවයන්ගෙන්ද (විශේෂයෙන්ම ඔවුන්, රජයන් විසින් සිදුකරනු ලබන කාර්යන් හා සමාන කාර්යන් සිදු කරන්නේ නම්) යන කරුණ සම්බන්ධයෙන් වර්ධනය වන අදහස් පද්ධතියක් පැවතිය ද එම ගැටලුව තවමත් එලෙසම පවතී.

**මෙමගින් තනි තනි පුද්ගලයින් පවා බැඳ තබන්නේද?**

අන්තර්ජාතික මානුෂවාදී නීතිය මගින් තනි පුද්ගලයින් මත බැඳීම් පනවන අතර ජිනීවා සම්මුති සහ පළමු අතිරේක සන්ධානය "බරපතළ ලෙස උල්ලංඝනය කිරීම" සහ අනෙකුත් නීති සහ යුද චාරිත්‍රයන් බරපතළ ලෙස උල්ලංඝනය කිරීම (යුද අපරාධ) සිදුකරන තැනැත්තන්ව ඒ සඳහා පුද්ගලික අපරාධමය වගකීමකට යටත් කල හැකි බවද දක්වයි. අන්තර්ජාතික මානුෂවාදී නීතිය මගින් එකී සියලු අපරාධ සිදුකර ඇතැයි සැක කරනු ලැබිය හැකි සියලු පුද්ගලයින් කෙරෙහි විශ්වීය අධිකරණ බලය ස්ථාපනය කරනු ලබයි. ජාත්‍යන්තර අපරාධ අධිකරණය බලාත්මක කිරීමේ ප්‍රවේශයත් සමඟ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමකදී යුද අපරාධ සිදුකරන පුද්ගලයින් හට ද අපරාධමය වගකීම පවරනු ලබයි.

අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීති ගිවිසුම් යටතේ සුවිශේෂී වගකීම් තනි තනි පුද්ගලයින් කෙරෙහි නොමැති වුවද අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය මගින් ද ජනසංහාරය, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සහ වධ හිංසා පමුණුවීම වැනි අන්තර්ජාතික අපරාධ සංස්ථාපනය කෙරෙන උල්ලංඝනයන් සඳහා පුද්ගලික අපරාධමය වගකීම පවරනු ලබයි. මෙම අපරාධයන් ද විශ්වීය අධිකරණ බලය යටතෙහිලා ගැනේ.

පූර්ව යුගොස්ලෝවියාව සහ රුවන්ඩාව සඳහා වූ තත් කාර්ය ජාත්‍යන්තර අපරාධ අධිකරණ මෙන්ම ජාත්‍යන්තර අපරාධ අධිකරණය සතුවද අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය යන නීති කාණ්ඩ දෙකටම එරෙහිව සිදුකරන උල්ලංඝනයන් සඳහා අධිකරණ බලය පවතී.

**මෙමගින් ආරක්ෂා වන්නේ කාවද?**

අන්තර්ජාතික මානුෂවාදී නීතිය මගින් සටනට සහභාගි නොවන හෝ තවදුරටත් සටන් නොවදින එදිරිවාදී සටන්කරුවන් ආරක්ෂා කිරීම අරමුණුකර ගනී. අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වල දී බලපාන ජිනීවා සම්මුතීන් යුද බිමේ දී තුවාල වන සහ රෝගීවන සන්නද්ධ බලකාවල පුද්ගලයින් හට (පළමු සම්මුතිය), මුහුදේදී තුවාල වන, රෝගී වන සහ මුහුදුබත් වන සන්නද්ධ බලකා වල සාමාජිකයින් හට (දෙවන සම්මුතිය), යුද සිරකරුවන් (තෙවන සම්මුතිය) සහ සිවිල් වැසියන් (සිව්වන සම්මුතිය) සම්බන්ධයෙන් ක්‍රියාකරයි. සිවිල් වැසියන් යන්නට අභ්‍යන්තරව අවතැන්වූවන්, කාන්තාවන්, ළමයින්, සරණාගතයින්, පුරවැසිභාවය රහිත පුද්ගලයින්, මාධ්‍යවේදීන් සහ අනෙකුත් පුද්ගල කාණ්ඩයන් ඇතුළත් වේ (සිව්වන සම්මුතිය සහ පළමු අතිරේක සන්ධානය).

එලෙසින්ම, අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලදී බලපාන නීතීන් (ජිනීවා සම්මුති හතර සඳහාම පොදු 3 වන වගන්තිය සහ දෙවන අතිරේක සන්ධානය) සටනට සහභාගි නොවන හෝ තවදුරටත් සටන් නොවදින පුද්ගලයින්ට රැකවරණය සැලසීම අරමුණුකර ගනියි.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය එදිරිවාදී හැසිරීම මත රීති පැනවීම මගින් ද සිවිල් වැසියන් ආරක්ෂා කරනු ලබයි. නිදසුනක් ලෙස, ගැටුමක පාර්ශවකරුවන් විසින් සෑම කල්හිම සිවිල් වැසියන් සහ යුදභටයින් අතර මෙන්ම යුද සහ යුද නොවන ඉලක්ක අතර වෙනස පැහැදිලිව වෙන්කොට හඳුනාගත යුතුය. සිවිල් ප්‍රජාව සම්පූර්ණ වශයෙන් හෝ සිවිල් වැසියන් තනි තනිව හෝ ප්‍රහාරය සඳහා ඉලක්කයක් නොවිය යුතුය. තවද, යුද අරමුණු කරා ප්‍රහාර එල්ල කිරීම මගින් සිවිල් වැසියන්ට සහ සිවිල් ඉලක්ක වලට සමානුපාතික නොවන හානියක් සිදුවන්නේ නම්, එවැනි ප්‍රහාරයන් යුද අරමුණු කරා එල්ල කිරීම තහනම්ය.

අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය සාමකාලය සඳහා මූලිකවම ගොඩනැගී තිබීම හේතුවෙන් සෑම පුද්ගලයෙකුටම බලපායි.

**ජාතික තලය තුළ බලාත්මක කිරීමට ඇති යාන්ත්‍රණය කුමක්ද?**

අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය බලාත්මක කිරීමට ඇති වගකීම රාජ්‍යයන් සතු ප්‍රථම සහ ප්‍රධාන වගකීමකි.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය හා

සම්පූර්ණ වශයෙන් අනුකූල වීම තහවුරු කිරීම අරමුණු කරගනිමින් සාමකාලය තුළදී මෙන්ම සන්නද්ධ ගැටුම් පවතින වාතාවරණයන් තුළත් නෛතික සහ ප්‍රායෝගික ක්‍රියාමාර්ග කිහිපයක්ම ගැනීමට රාජ්‍යයන්ට වගකීමක් පවතී. එකී ක්‍රියාමාර්ග අතරට:

- අන්තර්ජාතික මානුෂවාදී නීති ගිවිසුම් පරිවර්තනය කිරීම;
- දණ්ඩන නීති බලාත්මක කිරීම ඔස්සේ යුද අපරාධ වැළැක්වීම සහ දඬුවම් පමුණුවීම;
- රතු කුරුස සහ රතු අඩසඳ ලාංඡන ආරක්ෂා කිරීම;
- මූලික සහ අධිකරණමය සුරක්ෂාවන් ලබාදීම;
- අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳව දැනුවත්භාවය ලබාදීම;
- අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳව සුදුසුකම්ලත් නිලධාරීන්ව පුහුණු කිරීම සහ සන්නද්ධ බලකා සඳහා නීති උපදේශකයින් පත් කිරීම.

අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය තුළද එසැණින් හෝ ක්‍රමිකව සිය නීතීන් බලාත්මක කිරීමට රාජ්‍යයන්ට බැඳීම් ඇති කරන වගන්තීන් පවතී. ඔවුන් විසින් ගිවිසුම් වල දක්වා ඇති අයිතීන් බලාත්මක කිරීමට අවශ්‍ය වන ආකාරයේ විවිධාකාර ව්‍යවස්ථාදායක, පරිපාලන, අධිකරණමය සහ අනෙකුත් පියවර අනුගමනය කළ යුතුය. මේ සඳහා අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීති ගිවිසුම් මගින් තහනම් කොට ඇති ක්‍රියා බැහැර කිරීමත් වැළැක්වීමත් සඳහා අපරාධ නීති පැනවීමත්, හෝ යම් නිශ්චිත අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සඳහා දේශීය අධිකරණයන් ඉදිරියේ සහනයක් ලබා ගැනීම සඳහා පහසුකම් සැපයීම සහ එම සහනය බලාත්මක වන බව තහවුරු කිරීමත් ඇතුළත්ය.

**...... අන්තර්ජාතික මට්ටමෙන්?**

අන්තර්ජාතික වශයෙන් බලාත්මක කිරීම ගැන සැලකීමේදී, ජිනීවා සම්මුතීන් සියල්ලටම පොදු පළමු වගන්තිය යටතේ සෑම අවස්ථානුගත අවස්ථාවකදීම සම්මුතීන්ට ගරු කිරීමටත් එකී ගරුත්වය සුරක්ෂා කිරීමටත් රාජ්‍යයන්ට සාමූහික වගකීමක් පවතී. ආරක්ෂක බල යාන්ත්‍රණය, පරීක්ෂණ ක්‍රියාපටිපාටිය සහ පළමු සන්ධානයේ 90 වන වගන්තිය තුළ ඇතුළත් ජාත්‍යන්තර දත්ත ගවේෂණ කොමිසම යනාදියෙන් ද අධීක්ෂණ පද්ධතිය සමන්විතය. ජිනීවා සම්මුතීන් හෝ පළමු සන්ධානයට කරන ලද බරපතළ උල්ලංඝනයන් හිදී පළමු සන්ධානයට පාර්ශව වන රාජ්‍යයන් විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග සහයෝගීතාවයෙන් යුක්තව කටයුතු කිරීමටද බැඳී සිටී.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව යනු ජිනීවා සම්මුතීන්, ඒවායේ අතිරේක සන්ධාන සහ ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ ව්‍යාපාරයේ ව්‍යවස්ථා ප්‍රකාරව වරය හිමි මෙම පද්ධතිය තුළ වන ප්‍රමුඛ අංගයකි. එමගින් යුද වින්දිතයින්ට ආරක්ෂාව සහ සහය ලබා දීම තහවුරු කරන අතර රාජ්‍යයන්ට සිය අන්තර්ජාතික මානුෂවාදී නීති බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා දිරිගැන්වීමත් අන්තර්ජාතික මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කිරීමත් දියුණු කිරීමත් සිදුකරයි. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සතු මුල පිරීමේ අයිතිය මගින් එහි සේවා පිරිනැමීමට හෝ අන්තර්ජාතික මානුෂවාදී නීතියේ සද්භාවී භාවිතය තහවුරු කිරීමට අවශ්‍යයැයි සිතන ඕනෑම පියවරක් ගැනීමටත් ඉඩ සලසයි.

අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීති අධීක්ෂණ පද්ධතිය, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මගින් හෝ ප්‍රධාන අන්තර් ජාතික මානව අයිතිවාසිකම් නීති ගිවිසුම් මගින් ස්ථාපනය කරන ලද ආයතනයන්ගෙන් සමන්විත වේ. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය පදනම් කොටගෙන බිහිවූ ප්‍රධාන ආයතනය වනුයේ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂාව පිළිබඳ එහි අනු කොමිසමයි. අවසාන දශක දෙක තුළදී කොමිසම විසින් "සුවිශේෂී ක්‍රියාපටිපාටීන්" ද වර්ධනය කොට ඇති අතර, එනම් තේමාත්මක හෝ රාජ්‍ය-විශේෂී සුවිශේෂී රැපෝර්තුකරුවන්, සහ තම කලාපය තුළ වන මානව අයිතිවාසිකම් සිදුවීම් අධීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට අනුයුක්ත කර ඇති ක්‍රියාකාරී කණ්ඩායම් සිටී.

තවද, ප්‍රධාන අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීති ගිවිසුම් හයක් මගින්ම මානව අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීමට අනුයුක්ත කළ ස්වාධීන විශේෂඥයින්ගෙන් සමන්විත කමිටුවක් ස්ථාපනය කිරීම සඳහා මගපෙන්වයි.

සමස්ත වශයෙන් මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීම සඳහා මූලික වගකීම පැවරී ඇති මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරයි. මෙම කාර්යාලය මගින් එක්සත් ජාතීන්ගේ පද්ධති ප්‍රකාර ක්‍රියාවට නැංවීම සහ මානව අයිතිවාසිකම් සහයෝගීතාවය පුළුල් කිරීමටත්, මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට අවශ්‍ය ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර ශක්‍යතාවය ගොඩනැගීමටත් මානව අයිතිවාසිකම් පිළිබඳ ලේඛන සහ දත්ත බෙදාහැරීම මගින් එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් යාන්ත්‍රණයේ ඵලදායිතාවය වැඩි කිරීමට අරමුණු කරයි.

**............. කලාපීය මට්ටමෙන්?**

අන්තර්ජාතික මානුෂවාදී නීතිය වෙනුවෙන් වූ කලාපීය කාර්යයන් අභිබවා යමින් ප්‍රධාන කලාපීය මානව අයිතිවාසිකම් ගිවිසුම් යටතේ යුරෝපයේ, ඇමෙරිකාවේ සහ අප්‍රිකාවේ ස්ථාපිත කලාපීය මානව අයිතිවාසිකම් අධිකරණයන්හි සහ කොමිසම්හි කාර්යය, අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතියේ සුවිශේෂී ලක්ෂණයකි. කෙසේ වුවද, කලාපීය මානව අයිතිවාසිකම් යාන්ත්‍රණයන් විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතියට වන උල්ලංඝනයන් වැඩි වශයෙන් විභාග කරයි.

1950 යුරෝපා සම්මුතිය යටතේ එන මානව අයිතිවාසිකම් ආරක්ෂණය පිළිබඳ යුරෝපියානු පද්ධතියේ මානව අයිතිවාසිකම් පිළිබඳ යුරෝපියානු අධිකරණය යනු එහි කේන්ද්‍රයයි. ඇමෙරිකාව තුළ පවතින ප්‍රධාන කලාපීය අධීක්ෂණ පද්ධතීන් වනුයේ මානව අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ඇමෙරිකානු කොමිසම සහ මානව අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ඇමෙරිකානු අධිකරණයයි. 1981 මානව සහ මහජන අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු කොමිසම යනු අප්‍රිකානු ප්‍රඥප්තිය මගින් පිහිටුවනු ලැබූ අධීක්ෂණ පද්ධතියයි. මානව අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු අධිකරණයක් ස්ථාපිත කරන ගිවිසුමක් තවම බලාත්මක වී නැත.